# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 5 දරන
# ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 ජනවාරි මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1982 ජනවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 20 යි    තැපැල් ගාස්තුව: ශත 50 යි

# 1982 අංක 5 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 ජනවාරි මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 30/81

**1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1982 අංක 5 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි "1977 ජූලි මස විසි දෙවෙනි දිනට පසු ඒ ඉඩමට කරන ලද වැඩි දියුණු කිරීම් කිසිවක් වේනොහ් ඒ වෙනුවෙන් සාධාරණ මුදලකින් වැඩි කරනු ලැබූ" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 1979 අංක 17 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"ඒ වෙළෙඳ අගය සහ—

(අ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වන වගන්තියේ අතුරු වගන්තිය යටතේ නියෝගයක් කරනු නො ලැබුවේ යම් ඉඩමක් හෝ එහි සම්බන්ධතාවක් සම්බන්ධයෙන් ද ඒ ඉඩම හෝ සම්බන්ධතාව පිළිබඳව වූ අවස්ථාවක, ඒ පනතේ 7 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කරනු ලැබූ දින ඒ ඉඩමේ හෝ එහි සම්බන්ධතාවේ වෙළෙඳ අගය අතර වෙනසේ ; හෝ

(ආ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වන වගන්තියේ අතුරු වගන්තිය යටතේ නියෝගයක් කරනු ලැබුවේ යම් ඉඩමක් හෝ එහි සම්බන්ධතාවක් සම්බන්ධයෙන් ද ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාව පිළිබඳව වූ අවස්ථාවක, එම නියෝගය පළ කරනු ලැබූ දින ඒ ඉඩමේ හෝ සම්බන්ධතාවේ වෙළෙඳ අගය අතර වෙනසේ

සියයට පනහකින් වැඩි කරනු ලැබූ ;".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය අගට පහත දැක්වෙන අලුත් වගන්තිය එකතු කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) අධිකාරිය විසින් හෝ එය වෙනුවෙන් (1) වන උප වගන්තිය යටතේ ඇති කරනු ලැබූ යම් බැහැර කිරීමේ සාධන පත්‍රයකට වංචා වැළැක්වීමේ ආඥාපනතේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.".

4. මේ පනතේ ඉහතින් වූ විධිවිධානවලින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලැබූ සංශෝධන 1979 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. — සංශෝධන අතීතයට බලපෑම.

ඒ 59975—13,325 (31/12)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.